**තිරසර සංවර්ධන සභාව - 2020**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

තිරසර සංවර්ධන සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි. | සටහන් කරගන්නා ලද අතර හිඟ ගෙවීම් සඳහා මෙන්ම ඉදිරි වර්ෂවලට අදාළ ගෙවීම් සිදු කිරීම සඳහාත් වෙන් කිරීම් සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනයක් සැලැසිය යුතු වීම. |

### 1.6 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | තිරසර සංවර්ධන සභාවේ සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 දින හෝ ඊට ප්‍රථම විගණනය වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එම මූල්‍ය ප්‍රකාශන වර්ෂ 01 කට වැඩි ප්‍රමාදයකින් පසුව 2022 නොවැම්බර් 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2020 වර්ෂයේ දී ප්‍රමාණවත් තරම් කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා නොමැති අතර එම වර්ෂය තුළ කොරෝනා වසංගතය හේතුවෙන් කාර්යාල අඛණ්ඩව විවෘත කර නොතිබුණි. තවද මෙම වකවානුව තුළ සභාවේ සාමාජිකයින්/ සභාපති පත් කිරීමේ ප්‍රමාදයක් ද සිදු වී ඇත. සීමිත කාර්ය මණ්ඩලයක් පැවතීම මෙන්ම මූල්‍ය ප්‍රකාශය සඳහා කෙටුම්පත් සකස් කළ ද වරින් වර රේඛීය අමාත්‍යාංශය හා සභාවෙහි සාමාජිකයින්/ සභාපති වෙනස් වීම ද මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රමාද වීමට හේතු විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ)මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ කල් ඉකුත් වූ එකතුව රු.97,588 ක් වටිනා චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන ලද අතර වාර්තමානය වන විට මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීමෙන් අනතුරුව නිවැරදි කිරීම් සිදු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ)මුදල් රෙගුලාසි 446(2) | මුදල් පොතේ සියලුම සටහන් සඳහා වගකිව යුතු අධික්ෂණ හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් කෙටි අත්සන් තැබිය යුතු නමුත් සියලුම සටහන් සඳහා කෙටි අත්සන යොදා නොතිබුණි. | සටහන් කර ගන්නා ලද අතර උපදෙස් ලබාදීමෙන් අනතුරුව නිවැරදිව සටහන් තැබීමත් මුදල් පොතෙහි කෙටි අත්සන් යෙදීම නිවැරදි ව සිදු කිරීමත් අරඹා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ)මුදල් රෙගුලාසි 257 | ගෙවීම් වවුචර් 07 ක් මඟින් එකතුව රු.571,640 ක් ගෙවා තිබුණත්, එම වවුචර් අදාළ සහතික කිරීමේ නිලධාරියා විසින් සහතික කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලද අතර, උපදෙස් ලබාදීමෙන් අනතුරුව නිවැරදිව වියදම් සහතික කිරීම ආරම්භ කර ඇති. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ බැංකු ජංගම ගිණුමේ 2020 ජනවාරි 01 දිනට රු.2,407,716 ක ශේෂයක් පැවැතුණි. වර්ෂ අවසාන වන විට එම ශේෂය රු.2,184,582 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ බැංකු ජංගම ගිණුමේ රු.2,000,000 ක මුදල් ශේෂයක් නිෂ්කාර්යව පැවැතුණි. | 2020 වර්ෂයේ රට තුළ පැවැති කොරෝනා වසංගතය හේතුවෙන් වරින් වර කාර්යාල වසා දමා තිබෙන අතර සීමිත කාර්ය මණ්ඩලයක් පමණක් කැඳවා තිබේ. මෙම අනපේක්ෂිත තත්ත්වය හේතුවෙන් පූර්ව සැලසුම් අනුව ක්‍රියා කිරීමට නොහැකි වී තිබේ. මෙවැනි අවස්ථාවක මුහුණදිය හැකි පරිදි සුදුසු ක්‍රමවේද අනුගමනය කරමින් ඉලක්ක කරා ළඟාවීමට හැකිවන ලෙස මින් ඉදිරියට ක්‍රියා කළයුතු බවට උපදෙස් ලබාදෙන ලදී. | අරමුදල් විධිමත් ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 164,414 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් මාස හතරක කාලපරිච්ඡේදයේ අතිරික්තය රු. 5,880,468 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයේ මාස හතරකට අදාළ මූල්‍ය ප්‍රතිඵලය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සමඟ සැසඳීමේ දී රු.5,716,054ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඒ අනුව ඉකුත් වර්ෂයේ මාස හතරකට අදාළ වියදම රු.4,325,532ක් වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේ වියදම රු.13,663,075ක් වී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම රු.3,866,342ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණත්, එම වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා 2022 දෙසැම්බර් 02 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලද අතර ක්‍රියාත්මක කරවීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම ගැටළු සහගත වුවද විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කරමින් එම කාර්ය ඉටුකිරීමට බලාපොරොත්තු වේ. 2020 සහ 2021 වර්ෂවල දී කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වරින් වර කාර්යාල වසා තබා තිබීමත්, වරින් වර සීමිත කාර්ය මණ්ඩලයක් පමණක් සේවයට කැඳවා තිබීමත් මීට හේතු වී ඇත. තවද වර්තමානයේ ද ඉතාමත් සීමිත කාර්ය මණ්ඩලයක් මඟින් තිරසර සංවර්ධන විෂයයට අදාළ රාජකාරීන් පවත්වාගෙන යනු ලබන තත්ත්වයක කටයුතු කරනු ලබයි. | සභාවේ භෞතික වත්කම්වල පැවැත්ම තහවුරු කිරීමට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) සභාව පවත්වා ගෙන යනු ලබන ගොඩනැඟිල්ල වෙනුවෙන් මාසික කුලියක් ගෙවා නොතිබුණි. නමුත් ඒ බව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | එවකට පැවති රේඛිය අමාත්‍යාංශය පරිහරණය කළ ගොඩනැඟිල්ල තුළම කාර්යාලය පවත්වා ගෙන ගොස් තිබීම නිසා ගෙවීමක් කිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟී නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු. මිලියන 65 ක වියදම් ඇස්තමේන්තු කර තිබුණත්, තථ්‍ය වියදම රු.මිලියන 13.6 ක් වී තිබුණි. | 2020 වර්ෂයේ රට තුළ පැවැති කොරෝනා වසංගතය හේතුවෙන් වරින් වර කාර්යාල වසා දමා තිබෙන අතර සීමිත කාර්ය මණ්ඩලයක් පමණක් කැඳවා තිබේ. මෙම අනපේක්ෂිත තත්ත්වය හේතුවෙන් පූර්ව සැලැසුම් අනුව ක්‍රියා කිරීමට නොහැකි වී තිබේ. මෙවැනි අවස්ථාවක මුහුණදිය හැකි පරිදි සුදුසු ක්‍රමවේද අනුගමනය කරමින් ඉලක්ක කරා ළඟාවීමට හැකිවන ලෙස මින් ඉදිරියට ක්‍රියා කලයුතු බවට උපදෙස් ලබාදෙන ලදී. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| (ඈ) සභාව ඉකුත් වර්ෂයේ දී මාස 04ක කාලපරිච්ඡේදයක් පමණක් ක්‍රියාත්මක වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉකුත් වර්ෂයේ සංඛ්‍යා මාස 04කට අදාළ සංඛ්‍යා බව පැහැදිලි කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලද අතර ඒ පිළිබඳව නිවැරදිව සටහන් තැබීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශනවල කාලපරිච්ඡේදය පැහැදිලිව දැක්විය යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන සභාව සඳහා ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශය යටතේ මූලධන වියදම රු.මිලියන 3.15 ක ප්‍රතිපාදන 2020 වර්ෂය සඳහා සලසා තිබුණත්, ඉන් රු.මිලියන 1.55 ක් උපයෝජනය කර තිබුණි. එමෙන්ම පුනරාවර්තන වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 14.30 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 12.24 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් තිරසර සංවර්ධන සභාව වෙත සලසා තිබුණු පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.මිලියන 2.06 ක් හෙවත් සියයට 14 ක හා රු. මිලියන 1.6 ක් හෙවත් සියයට 51 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | 2020 වර්ෂයේ රට තුළ පැවැති කොරෝනා වසංගතය හේතුවෙන් වරින් වර කාර්යාල වසා දමා තිබෙන අතර සීමිත කාර්ය මණ්ඩලයක් පමණක් කැඳවා තිබේ. මෙම අනපේක්ෂිත තත්ත්වය හේතුවෙන් පූර්ව සැලැසුම් අනුව ක්‍රියා කිරීමට නොහැකි වී තිබේ. මෙවැනි අවස්ථාවක මුහුණදිය හැකි පරිදි සුදුසු ක්‍රමවේද අනුගමනය කරමින් ඉලක්ක කරා ලගාවීමට හැකිවන ලෙස මින් ඉදිරියට ක්‍රියා කළයුතු බවට උපදෙස් ලබාදෙන ලදී. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හැකිතාක් නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතුවීම. |